# India's Disappearing Daughters

India' s traditional preference for baby boys has resulted in the extermination of generations of females with thousands of fetuses or new born babies being killed daily for no apparent reason rather than being girls.

"One of the most disturbing revelations came from a midwife who said she had killed hundreds of newborns," journalist Gita Aravamudan told Agence France-Presse (AFP) in an interview wired Friday, July 20. "She had lost count."

Aravamudan has written a book, "Disappearing Daughters", about the gruesome practice in the Hindu-majority country, including stories of women forced to endure successive pregnancies to produce male children and of others forced to have up to four abortions in five years.


"Female infanticide is akin to serial killing. But female feticide was more like a Holocaust," Aravamudan writes. "A whole gender is getting exterminated. It is a silent and smoothly executed crime which leaves no waves in its wake." In the past, India's unwanted baby girls have been drowned in milk, burned alive in sealed mud pots or fed milk laced with poisonous seeds.

But nowadays, they are killed in their mothers ' wombs as technology enables doctors now to know the gender of the fetus in early pregnancy stages.

India has only 927 females for every 1,000 males -- far lower than the worldwide average of 1,050 females. Almost 7,000 girls are killed through abortions every day, according to a UNICEF report. The British medical journal The Lancet has put the loss of females at 10 million over the past two decades.

"With technology making it easier to find out the gender of a fetus in earlier stages of pregnancy, these numbers will only increase," said Aravamudan.

In India, sons are typically seen as breadwinners. According to Hindu traditions, a son is also supposed to light his parents ' funeral pyre. On the contrary, girls are often viewed as a burden because of the matrimonial dowry demanded by a groom's family.



**Gita Aravamudan the author of the book " Disappearing Daughters"**

## Abuses

Fearing abuses of their daughters, many Indian women are determined to abort themselves if they find their fetus is a girl to spare her a nightmarish life. "Better to send her straight to heaven rather than make her endure this beating and kicking around," one woman is saying in Aravamudan 's book.

Others said are overpowered by their husbands. "What do you want from me? What power do you think I have over my womb? None," said another woman. "Do I have the right to decide if I can keep the child if it is a girl? No."

The killing of girls has led to grave consequences in some Indian areas. In some regions, an acute shortage of women has resulted in men buying brides and sharing them with their brothers. Aravamudan 's book tells of Tripala Kumari, 18, whose husband killed her because she refused to have sex with his brothers.

To stop the gruesome practice, India has introduced tough laws against tests to determine fetal gender for non-medical reasons. Early July, the Indian government announced plans to register all pregnancies. The data would permit authorities to focus efforts on areas with a large gap between the number of pregnancies recorded and births.
However, the rules are widely flouted by doctors in what activists say is a multi-million-dollar business. The tests are done secretly and are often hard to prove. "Our laws against dowry and feticide are excellent, but only on paper," said Aravamudan.



***After giving birth to a daughter, a mother is reluctant to go home to face the wrath of her husband's family. This is India.***
**දියණියක් ලැබුවාට පසු ඇය රෝහලේ සිට ගෙදර යාමට බියවෙයි. ගෙදර දී සැමියාගේ පවුලේ අයගේ කෝපයට ලක්වන්නේය.**

# අතුරුදහන් වන ඉන්දියාවේ දියණියෝ

ඉන්දියාවේ සම්ප්‍රදායික ජනසමාජය සැදි ඇත්තේ පිරිමි ළමයින් ප්‍රිය කරන්නටත් ගැහැණු දරුවන් අප්‍රිය කරන්නටත්ය. මේ නිසා උපදින ගැහැණු ළමයින් වසරකට දහස් ගණනක් බඩේ කළල අවස්ථාවේදීම හෝ ඉපදුණු පසුව හෝ විනාශකර දමති.. මේ අන්කිසිවක් නිසා නොව ඒ දරුවන් ගැහැණු ළමයින් නිසාය.

මේ කාරණය සොයා බැලීමේදී එළිවූ ඉතා වේදනාත්මක පුවත වූ කලී එක් වින්නඹු මවක් තමාගේ අතින්ම සිය ගණනක් ගැහැණු ළමයින් ඉපදුණු සැනින් විනාශයට පත්වූ බව හෙළිකිරීමයි. ඉන්දියාවේ සුප්‍රකට පත්‍රකලාවේදිනියක වන ගීතා අරවමුදන් මහත්මිය මේ බව හෙළිකරන්නේ මෙම ඉන්දියාවේ ගැහැණු දරුවන් විනාශකිරීම ගැන ඇය ලියන ලද -

***අතුරුදහන්වන ඉන්දිය දියණියෝ***

නම් මෑතක පළ කරන ලද පොතෙහිය. ලැබෙන දරුවා පුතෙක් ද දුවෙක්ද යයි නොදන්නා අතීතයේ දී පවා මෙය සිදුවීයයි කතුවරිය පවසයි. එකල බිළිඳු දියණියන්ට කිරිවලට කළවම්කර වස පොවන පවත්, ඔවුන්ට වධ හිංසාකර මියෙන්නට සළස්වන බවත්, නැතිනම් පණපිටින් හොර රහසේම වළලන බවත් පොතේ සඳහන් වෙයි. එහෙත් වර්තමානයේ තාක්ෂණය අනුව ස්කෑන් මගින් දරුවාගේ ලිංගිකත්වය දැනගත් විට ගැහැණු දරුවෙකු නම් බඩේදීම ඇය විනාශකිරීම සිදුවන්නේය.

හින්දු සම්ප්‍රදායට අනුව පුතෙක් පවුලට භාග්‍ය ගෙනෙන හම්බකර දෙන තැනැත්තාය. දුවගෙන් ඒ කිසිවක් නොලැබෙන නිසාත් ඇය විවාහකර දීමට දෑවැද්ද සෙවිය යුතු නිසාත් දියණිය පවුලට අවාසනාව ගෙනෙන මහත් බරක් ලෙස ඉන්දියාවේ සැලකේ. එනිසා ගැහැණු ළමයින්ට තැනක් නැත.

මෙසේ ගැහැණු ළමයි සීග්‍රයෙන් වඳවීගෙන යන නිසා ඉන්දියාවේ සමහර ප්‍රාන්ත වල දැඩි ගැහැණු හිගයක් පවතී. ඒ නිසා ඇතැම් පවුල්වල සහෝදරයින් කීපදෙනෙකුටම එක බිරිඳක් ගෙනඒම ද සිදුවන්නේය.

මෙම බිළිඳු ඝාතනය නවත්වන්නට ඉන්දීය රජය දැඩි නීති රීති පණවා ඇතත් ඒ ගැන නොතකා ක්‍රියාකිරීම තවමත් දිගටම සිදුවේ. දැඩි හින්දු බලපෑමෙන් මිදෙන්නට ඉන්දියාවට කිසිදින බැරිය.



**Three Armed Forces representatives, Flight Lt. Suresh Fernando (SLAF), Lt. Saliya Jayawardane (SLA) and Lt. Chathura Gamage (SLN) who were injured in the battle front, cut the cake at the maiden Sunday Observer Youth Club get-together at the Trans Asia Hotel last week.**
***ශ්‍රීලංකාවේ සන්ඩේ ඔබ්සර්වර් තරුණ සමාජය ඇරඹීම නිමිති කොට මේ නොබෝදා කොළඹ ට්‍රාන්ස් ඒෂියා හෝටලයේ පැවති සාදයේදී ත්‍රිවිධ හමුදාව නියෝජනය කරමින් හමුදා නිලධාරීන් තිදෙනෙක් කේක් ගෙඩිය කැපූ අවස්ථාවයි.***





# ප්‍රභාකරන් උඹ කොහේද?

**කො**ටි සංවිධානෙ දැන් ටික කලකට ඉස්සර ශ්‍රීලංකාවෙ සිතියම අඑතෙන් ඇන්දා. යාපනේ ඉඳලා දෙපැත්තෙන් බේරෙන රතු සායම් වලින්. වම් පැත්තෙන් මීගමුව ළඟට එනකල්. දකුණු පැත්තෙන් මඩ කලපුව, පොතුවිල් පාස්කරගෙන පල්ලෙහාටම ඇවිත් කතරගමටම එනකල්. ඒ තමයි කොටින් අයිතිවාසිකම් කියපු ඊළම් රාජ්‍යය. ඇන්ටන් බාලසිංහම් ලන්ඩන්වල තිබුණු ඒ කාලෙ කොටි සමුළුවකදි කියලා තිබුණා, මේ සිතියම තව ඉස්සරහට තවත් පුළුල්ව පැතිරෙන බව. කොටි සංවිධානෙට වෙනස් ලංකාවක් ඇතිකරන්න හැකියාව තිබෙන බව කිව්වා. මේවා අහනකොට එදා දෙමළ ජනයා ප්‍රීතිඝෝෂා පැවැත්තුවා. එපමණක් නෙවෙයි ලන්ඩන්වල, පැරිසියෙ, ඩෙන්මාර්ක්වල, කැනඩාවෙ, ජර්මණියෙ ඔය ආදී රටවල මේ කියන අළුත් ඊළම් ලංකා සිතියම අච්චුගහල දහස් ගණනින් බෙදා හැරියා. ඒක දකින්න දකින්න කොටින්ගෙ පිං පෙට්ටිවලට හෝගාලා පවුම් ඩොලර් සල්ලි වැටෙන්න පටන්ගත්තා. දෙමළ අය විස්වාස කළා 2008 වෙකොට ඊළම් රාජ්‍යය හැදෙනවා කියලා. අර පැත්තෙන් තමිල් නාඩුවත් විස්වාස කළා ඒක වේවි කියලා.

මෙහෙම තිබුණු සිතියම 2006 ජූලි මාසෙ ඉඳලා වෙනස් කරන්න ශ්‍රීලංකා සන්නද්ධ හමුදාවලට පුළුවන් වුණා. මේ සම්මජාතියෙදි වෙන්නෙ නැතෙයි කියපු ඊළම් රාජ්‍යය පරණ අම්බලමක් වගේ පතුරු ගැලවිලා වැටෙන්න පටන්ගත්තා මුළු ලෝකයේම ඇස් ඉදිරියේ. බාලසිංහම්ලා පම්පෝරි ගහපු අර සිතියමේ දැන් ඉතුරුවෙලා තියෙන්නෙ සිතියමේ ප්‍රමාණයෙන් බැලුවම අහල් බාගයක් විතර. ඒ කියන්නෙ මුලතිව් කැලෑව විතරයි. ඒකත් නැතිවෙන්න ඔන්න මෙන්න. ඒක හෙට වෙන්න පුළුවන්. අනිද්දා වෙන්න පුළුවන්. හැබැයි වෙනවා

ප්‍රභාකරන් මෙතෙක් ඉස්සරහට ආවෙම නැහැ. ඒ යකා කොහේ ඉන්නවද කියලා කවුරුවත් දැනගන හිටියෙ නැහැ. ඒ අතරෙ මැන්ව දෙවියෙක් ගණනට පුම්බල තියන දේවල් පත්තර වල වෙබ් අඩවි වල පළවුණා. තවම කවුරුවත් හරියට දන්නෙ නැහැ මූ ඉන්නවද, නැද්ද කියලා. සමහරු කියනවා ප්‍රභාකරන් මැරිලය, මැරුණෙ අවුරුදු ගණනකට ඉස්සෙල්ලා හැංගිලා ඉන්න බංකර් එකට ආපු පොළහෙක් දෂ්ට කරලාලු. තව කතාවක් තමයි ප්‍රභාකරන් පහුගිය 2004 සුනාමිය දවසෙ කිලිනොච්චියෙ පල්ලියක නත්තල් දවසෙ රෑ පූජාවට ගිය වෙලාවෙ සුනාමියට අහු වෙලා ගහගෙන ගියයි කියන එක. ප්‍රභාකරන්ගෙ බිරිඳ ළමයි දෙන්නත් අරන් පිටරට ගියෙත් ඒ නිසාලු. ඔය කතා අනන්තයි. එතකොට මේ කොටි වීර දිනයට කතාව පවත්තන ප්‍රභාකරන් කවුද? ආ.... ඒ මැන් වගේම මහත, උඩුරැවුල වවපු වෙන කොටියෙක්ලු. ඒ වගේ කොටි පස් දෙනෙක් ඉන්නවයි, එක එක කාලෙට කොටි සංවිධානෙ මේ මහත කොටියෙක් ඉස්සරහට දානවයි මේ තමයි ප්‍රභාකරන් කියලා. තව මතයක් තමයි, ඇත්ත ප්‍රභාකරන්ගෙ කණේ මවිල් ගස් කීපයක් සහ, ඉස්සරහ දත් දෙක අතරෙ හිඩැසක් තියන බව. ඒක අහුවෙන හන්දලු දැන් ඉන්න එකා හිනාවෙන්නෙ නැතුව බුම්මගෙන ඉන්නෙ. ඒකටත් එක්කලු තමිල් වෙල්වම් පොල් කැල්ල පෙන්නලා හැම තිස්සෙම හිනාවුණේ.

මේ කතා කොහොම වුනත් ඇත්ත කාරණාව තමයි දැනට කොටි හමුදාවෙ ඉන්න සාමාජිකයන්ගෙනුත් තුන් කාලක්ම ප්‍රභාකරන් කවුද කියල හරියට දැකලා නැහැ. පිටරටවල ඉන්න දෙමළ අයගෙන් දහ දෙනෙක්වත් ඌව හැබැහින් දැකලා නැහැ. දැකලා තියෙන්නෙ පින්තූරෙන් විතරයි.

දෙමළ කොටි ප්‍රචාර වලින් තමයි සංවිධානෙ පුම්බලා තියන්නෙ. එහෙම නොකළානම් කොටින්ගේ බැංකුවට සල්ලි වැටෙන්නෙ නෑ. කොටි තවම කියන්නෙ හෙට ඊළම් රාජ්‍යය හදන බව.

ජාතිවාදීකම් පැත්තකට දාලා සිංහළ මිනිස්සුත් එක්ක සමගියෙන් හිටියා නම් කොච්චර හොඳද කියලා දෙමළ මිනිස්සු දැන්වත් තේරුම් ගන්න ඕන. ලංකාව අපි කාටත් සමසේ අයිති රටක් කියලා දෙමළ මිනිස්සු ඇයි හිතන්නෙ නැත්තෙ? ඇයි කැල්ලක් කඩාගන්න පෙරේතකම. ඉතිහාසෙ පුරාම උඹලා සැරින් සැරේ කරලා තියෙන්නෙ ඔය ටික. ඒ පෙරේතකම නිසා තමන්ගෙ සහෝදරයො, පවුලෙ අය, උන් හිටි තැන් දෙමළ මිනිස්සු නැතිකර ගත්තා. ඒකට දැන් සිංහළ මිනිස්සුන්ට දොස් කියලා වැඩක් නෑ. ප්‍රභාකරන්ට දොස් කියාපල්ලා. ඌව හම්බ වුනොත් උගෙන් මූණටම අහපල්ලා, " ඇයි තම්බි උඹ අපිට මෙහෙම කළේ ?" කියලා. මං හිතන්නෙ නැහැ උඹලට ඒකට ඉඩක් හම්බ වෙයි කියලා.

♦ වෙලේගෙදර රාළ London